# මානව හිමිකම් සුරක්ෂිත කිරීමේ යාන්ත්‍රණයන්


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

# මානව හිමිකම් සුරක්ෂිත කිරීමේ යාන්ත්‍රණයන්

ISBN 978-955-8929-21-6

| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | : | 2015 |
| උපදේශකත්වය | : | නීතිඥ නිමල් පී පුංචිහේවා<br>නීතීඥ සමන්ති ජයමාන්න පරණගම |
| සංස්කරණය | : | නීතිඥ මේනකා හේරත්<br>නීතීඥ කේ. කපිලන් විල්ලවරාජන් |
| සහාය | : | තුෂාරා ජීවන්ති |
| කවර නිර්මාණය<br>පිටුසැකසුම සහ මුද්‍රණය | : | විකුම් ග්‍රැෆික්ස්, නො 33, මායා මාවත,<br>පතිරගොඩ, මහරගම. |
| ප්‍රකාශනය | : | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව<br>අංක 165, කින්සි පාර, කොළඹ 08. |

ISBN 978-955-8929-21-6

9 789558 929216

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මහජන ව්‍යාපෘතියකි

| පටුන | | පිටුව |
|---|---|---|
| හැඳින්වීම | | |
| 1.0 | අන්තර් ජාතික යාන්ත්‍රණය | 1 |
| 1.1 | ප්‍රඥප්ති පදනම් කරගත් මානව හිමිකම් යාන්ත්‍රණ | 3 |
| 1.1.1 | එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ මණ්ඩලය | 3 |
| 1.1.2 | කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ කොමිසම | 4 |
| 1.1.3 | මානව හිමිකම් කවුන්සිලය | 4 |
| | අ) පැමිණිලි ක්‍රියාපටිපාටිය | 5 |
| | ආ) විශ්ව කාලාන්තර සමාලෝචනය | 6 |
| | ඇ) විශේෂ ක්‍රියාපටිපාටි | 7 |
| 1.1.4 | ජාත්‍යන්තර අධිකරණය | 7 |
| 1.2 | ගිවිසුම් පදනම් කරගත් මානව හිමිකම් යාන්ත්‍රණ | 8 |
| 1.2.1 | ගිවිසුම් සංවිධාන විසින් සිදු කරනු ලබන්නේ කුමක්ද ? | |
| 1.2.2 | මානව හිමිකම් ගිවිසුම් සංවිධාන - පැමිණිලි ක්‍රියා පටිපාටීන් | 10 |
| 1.2.3 | තනි පුද්ගල සන්දේශ | 11 |
| 1.2.4 | පැමිණිලි ඉදිරිපත් කළ හැක්කේ කවුරුන් විසින්ද? | 13 |
| 1.2.5 | ඔබගේ පැමිණිල්ල මගින් ලබා දිය යුතු තොරතුරු මොනවාද? | 13 |
| 1.2.6 | සන්දේශයෙහි පිළිගත හැකි බව | 13 |
| 1.2.7 | අන්තර් රාජ්‍ය පැමිණිලි | 16 |
| 1.2.8 | විමසීම් කිරීම් | 17 |
| 1.3 | වෙනත් අන්තර්ජාතික යාන්ත්‍රණ | 18 |
| 1.3.1 | මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය | 18 |
| 1.3.2 | ජාත්‍යන්තර අපරාධ අධිකරණය | 19 |
| 2.0 | කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණ | 20 |
| 3.0 | ජාතික යාන්ත්‍රණය | 22 |
| 3.1 | මූලික අයිතිවාසිකම් පදනම් කරගත් යාන්ත්‍රණයන් | 22 |
| 3.1.1 | ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය | 22 |
| | අ) විධිමත් පැමිණිලි කිරීමේ ක්‍රමය | 23 |
| | ආ) අවිධිමත් පැමිණිලි කිරීමේ ක්‍රමය | 24 |
| 3.1.2 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) | 24 |
| 3.1.3 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 25 |
| 3.2 | මූලික අයිතිවාසිකම් පදනම් කර නොගත් යාන්ත්‍රණයන් | 27 |
| 3.2.1 | නීති ආධාර කොමිෂන් සභාව | 27 |
| 3.2.2 | නීති කොමිසම | 28 |
| 3.2.3 | සමථ මණ්ඩලය | 29 |
| 3.2.4 | විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා | 29 |
| 3.2.5 | ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ඇති අනෙකුත් ආයතන | 31 |
| ඇමුණුම් 01 | ජාත්‍යන්තර මානව හිමිකම් ආයතනවල ලිපිනයන් | 36 |
| ඇමුණුම් 02 | මානව හිමිකම් සඳහා සහන ලැබිය හැකි දේශීය ආයතනවල ලිපිනයන් | 39 |
| ඇමුණුම් 03 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය / ප්‍රාදේශීය කාර්යාල ලිපිනයන් | 40 |

# හැඳින්වීම

වර්තමානයේ මානව හිමිකම් අධීක්ෂණය, ප්‍රවර්ධනය, ආරක්ෂණය කිරීමට සහ ඒ පිළිබඳව උපදෙස් ලබාදීම සඳහා විවිධ මානව හිමිකම් ආයතන සහ ක්‍රියාකාරකම් විශාල වශයෙන් බිහි වෙමින් පවතී. 1945 ඔක්තෝබර් 24 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරම්භයත් සමග මානව හිමිකම් පිළිබඳ ව ලෝකය තුල නවමු ප්‍රබෝධයක් හට ගන්නා ලදි.

තවදුරටත් 1948 දෙසැම්බර් 10 වන දින මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එළිදැක්වීමෙන් පසු, එය පදනම් කරගෙන විටින් විට විවිධ ජාත්‍යන්තර ගිවිසුම් සහ කලාපීය ගිවිසුම් ඇති කරගනු ලැබූ අතර එය ජාත්‍යන්තර සහ කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීමට ඉවහල් විය.

ඒ අතර රාජ්‍යයන් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් ඔවුන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ වෙනත් දේශීය පනත් තුළට ඇතුළත් කර, එයට අනුව දේශීය මානව හිමිකම් යන්ත්‍රණයන් ස්ථාපිත කරමින් සහ ශක්තිමත් කරමින් පවතී. එපමණක් නොව දේශීය යාන්ත්‍රණය හරහා සෑහීමට පත්විය හැකි සහනයන් නොලැබෙන අවස්ථාවලදී කලාපීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණයට ජනතාවට ළඟාවීමට විවිධ නව ක්‍රමවේදයන් සකස් කොට ඇත.

මෙවැනි දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර යාන්ත්‍රණ මහජනතාවගේ අයිතිවාසිකම් ජයග්‍රහණය කිරීමට සහ සහතික කිරීමට කාර්යක්ෂම, වඩාත්ම සුදුසු සහ සාධාරණ අයුරින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

එමෙන්ම මහජනතාව මෙම යාන්ත්‍රණ සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබා ගෙන නියමාකාරයෙන් මෙම යාන්ත්‍රණ උපයෝගී කර ගත යුතුය.

එමගින් මෙම යාන්ත්‍රණ ස්ථාපිත කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගත හැකි බවට කිසිදු සැකයක් නොමැත.

මෙම සියලු අරමුණු කැටි කොට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකස් කිරීමට යෙදී ඇති මෙම මානව හිමිකම් යාන්ත්‍රණය සම්බන්ධයෙන් වූ අත්පොත ඵලදායි අයුරින් පරිහරණය කිරීමෙන් රටතුළ වඩා ශක්තිමත් මානව හිමිකම් සංස්කෘතියක් ස්ථාපිත කිරීමට අවැසි දායකත්වය සපයනු ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඔබ සැමගෙන් බලාපොරොත්තු වේ.

# 1.0 අන්තර්ජාතික යාන්ත්‍රණය

මානව හිමිකම් ආරක්ෂා කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ යාන්ත්‍රණ පහත සඳහන් පරිදි වේ.

- අන්තර්ජාතික යාන්ත්‍රණය
- කළාපීය යාන්ත්‍රණය
- ජාතික යාන්ත්‍රණය

මානව හිමිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ගෝලීය සැලැස්මක් නිර්මාණය කර තිබේ. ජගත් මානව හිමිකම් නීති සම්පාදනය සඳහා මුළු ලොවම පිළිගත් අන්තර්ජාතික අධිකරණ බලය සහිත එකම බහුපාර්ශවීය රාජ්‍ය සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවිධානය වේ.



**ඡායාරූප 1 : එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ආරක්ෂණ පද්ධතිය ප්‍රධාන අංග තුනකින් සමන්විත වේ.

1. ප්‍රඥප්ති, නීතියෙන් බැඳීමක් ඇති කරවන ගිවිසුම්, බැඳීමක් ඇති නොකරන ප්‍රකාශන, සහ ලිපි ලේඛන මගින් අන්තර්ජාතික ප්‍රමිති ස්ථාපිත කරයි.

2. විශේෂ වාර්තාකරුවන්ට, ප්‍රවීනයින්ට, සහ ක්‍රියාකාරී කණ්ඩායම්, කමිටු සහ ගිවිසුම් ගත සංවිධාන වැනි කණ්ඩායම් සඳහා විවිධ කටයුතු පරීක්ෂා කිරීමට බල අධිකාරයන් ලබා දෙයි.

3. මානව හිමිකම් ක්ෂේත්‍රයේ උපදේශක සේවාවන් සහ තාක්ෂණික සහාය ලබාදීම සඳහා ස්වේච්ඡා අරමුදල් ලබාදීම මගින් එය විසින් තාක්ෂණික සහාය පිරිනමයි.

මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලබා දෙන ආරක්ෂණ ක්‍රමය සඳහා පහත සඳහන් දෑ පදනම් කර ගනී.

- ප්‍රඥප්ති පදනම් කරගත් යාන්ත්‍රණය
- ගිවිසුම් පදනම් කරගත් යාන්ත්‍රණය

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති පදනම් කරගෙන පිහිටවූ ආයතන හරහා මානව හිමිකම් ආරක්‍ෂා කිරීමට යොදා ගන්නා යාන්ත්‍රණ, ප්‍රඥප්ති පදනම් කරගත් යාන්ත්‍රණ වේ. එක්සත් ජාතීන් විසින් ඇතිකරගත් ගිවිසුම් අනුව පිහිටවූ ආයතන හරහා මානව හිමිකම් ආරක්‍ෂා කිරීමට යොදා ගන්නා යාන්ත්‍රණ, ගිවිසුම් පදනම් කරගත් යාන්ත්‍රණ වේ. ඉහත දැක්වූ යාන්ත්‍රණ වල වෙනස්කම් පහත වගුවෙන් දක්වා ඇත.

| ප්‍රඥප්ති පදනම් කරගත් යාන්ත්‍රණ | ගිවිසුම් පදනම් කරගත් යාන්ත්‍රණ |
|---|---|
| එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි අඩංගු විධිවිධාන වලින් ඒවා පිහිටුවීම මූලාරම්භ කර ඇත. | විශේෂ නීති ලේඛනයක අඩංගු විධිවිධාන වලින් ඒවායේ පැවැත්ම ආරම්භ වේ. |
| පුළුල් මානව හිමිකම් බල අධිකාරියක් දරයි. | වඩා පටු බල අධිකාරියක් දරයි. (නියමිත ගැටළු නීති ලේඛන වල සංග්‍රහ ගත කර ඇත) |
| එක්සත් ජාතීන්ගේ සාමාජිකයින්ට අදාළ වේ. | සීමිත පිරිසකට අදාළ වේ. (නීතිමය ලේඛනය අපරානුමත කර ඇති රටවල් පමණක්) |
| බහුතර ඡන්දය පදනම් කර ගෙන ක්‍රියාමාර්ග ගනියි.<br><br>උදා: ආර්ථික සහ සමාජ මණ්ඩලය<br>ආරක්ෂක මණ්ඩලය<br>ජාත්‍යන්තර අධිකරණය<br>භාර මණ්ඩලය | පොදු එකඟත්වය මත පදනම්ව තීරණ ගනියි.<br>උදා:-<br>- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය<br>- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය<br>- ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය<br>- වධහිංසා පැමිණවීම් වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය |

## 1.1 ප්‍රඥප්ති පදනම් කරගත් මානව හිමිකම් යාන්ත්‍රණ

ප්‍රඥපත්ති පදනම් කරගනිමින් පිහිටවූ මානව හිමිකම් ආයතන වලට සාමාජික රටවල මානව හිමිකම් තත්ත්වය සමාලෝචනය කිරීම සඳහා බල අධිකාරිය ඇත. එම ආයතන පහත දක්වා ඇත.

### 1.1.1 එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ මණ්ඩලය (ECOSOC)

එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන නියෝජිත ආයතන හයෙන් එකක් වේ. එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ

මණ්ඩලය සාමාජිකයින් 54 දෙනෙකුගෙන් සමන්විත වේ. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශේෂඥ නියෝජිත ආයතන වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ලෝක සෞඛ්‍යය සංවිධානය අතුළුව ආයතන 14 ක සමාජ, ආර්ථික සහ ඒ ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලබයි.

### 1.1.2 **කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ කොමිසම** (CSW)

කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ කොමිසම එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක කොමිසමකි. මෙම කොමිසම මගින් ලොව පුරා කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමානත්වය පිළිබඳ ප්‍රගතිය ඇගයීම, අභියෝග හඳුනාගැනීම, ගෝලීය ප්‍රමිති සකස් කිරීම, සහ ස්ත්‍රී පුරුෂ සමානත්වය ප්‍රවර්ධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට අවශ්‍ය ස්ථිර ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සිදු කරනු ලබයි.

### 1.1.3 **මානව හිමිකම් කවුන්සිලය** (Human Rights Council)

ලොව පුරා මානව හිමිකම් ශක්තිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීමේ වගකීම දරන මානව හිමිකම් කවුන්සිලය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් යෝජනා 60/251 යටතේ 2006.03.15 වන දින පිහිටවනු ලැබීය.



**ඡායාරූප 2 : මානව හිමිකම් කවුන්සිලය**

එය රටවල් 47 කින් සැදුම්ලත් එක්සත් ජාතීන්ගේ සංවිධාන පද්ධතිය තුළ පිහිටි අන්තර් රාජ්‍ය සංවිධානයකි. මානව හිමිකම් කවුන්සිලයේ සාමාජිකයින් 47 දෙනා භූගෝලීය පදනම මත නම් කරනු ලබයි.

| කලාපය | සාමාජිකයින් ගණන |
|---|---|
| අප්‍රිකානු | 13 |
| ආසියානු | 13 |
| ලතින් ඇමරිකානු | 08 |
| උතුරු යුරෝපය හා අනෙක් රටවල් | 07 |
| නැගෙනහිර යුරෝපය | 06 |

මෙහි සාමාජිකයින්ගේ ධුර කාලය අවුරුදු 03 කි.

පැමිණිලි ක්‍රියාපටිපාටිය, විශ්ව කාලාන්තර සමාලෝචනය (Universal Periodic Review) සහ විශේෂ ක්‍රියා පටිපාටි වැනි ක්‍රියාකාරකම් රාශියක් එයට අයත් ක්‍රියාකාරකම් අතර වේ.

## අ) පැමිණිලි ක්‍රියාපටිපාටිය

- ලෝකයේ ඕනෑම ප්‍රදේශයක ඕනෑම වාතාවරණයක් යටතේ සිදුවන, ස්ථිර සහ විශ්වාස කළ හැකි ආකාරයට සහතික කළ මානව හිමිකම් සහ සියළුම ආකාරයේ මූලික නිදහස උල්ලංඝනයවීම් පිළිබඳ කටයුතු කිරීම සඳහා නව පැමිණිලි ක්‍රියාපටිපාටියක් මානව හිමිකම් කවුන්සිලය විසින් පිළිගෙන තිබේ.

- මෙම පැමිණිලි ක්‍රියාපටිපාටිය අපක්ෂපාතී, විෂයානුබද්ධ, ඵලදායී, වින්දිතයා අරමුණු කරගත්, සහ කාලෝචිත ආකාරයෙන් පවත්වනු ලබන ක්‍රියාපටිපාටියක් වේ.

- විශේෂ ක්‍රියාකාරී මණ්ඩල දෙක සන්දේශ (Communication) පිළිබඳ පරීක්ෂා කර බලා කවුන්සිලයේ අවධානයට යොමුකරවීම සඳහා වූ බලතල සහිතව සන්දේශ පිළිබඳ ක්‍රියාකාරී මණ්ඩලය සහ තත්ත්වයන් පිළිබඳ ක්‍රියාකාරී මණ්ඩලය පිහිටුවා තිබේ.

- සංදේශ පිළිබඳ ක්‍රියාකාරී මණ්ඩලය විසින් ලැබෙන සංදේශයේ පිළිගත හැකි බව සහ යෝග්‍ය බව තක්සේරු කරනු ලබයි.

- තත්ත්වයන් පිළිබඳ ක්‍රියාකාරී මණ්ඩලය විසින් රාජ්‍යයන්ගෙන් ලැබෙන සන්දේශ සහ පිළිතුරු මෙන්ම කවුන්සිලය විසින් පැමිණිලි ක්‍රියාපටිපාටිය යටතේ දැනටමත් භාරගෙන ඇති තත්ත්වයන් පිළිබඳ පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි. එමෙන්ම ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ කවුන්සිලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ද මෙම මණ්ඩලය මගින් සිදු කරනු ලබයි.

## ආ) විශ්ව කාලාන්තර සමාලෝචනය (Universal Periodic Review)

- විශ්ව කාලාන්තර සමාලෝචනය යනු මානව හිමිකම් කවුන්සිලය මගින් සෑම වසර හතරකට වරක්ම ඉදිරිපත් කරනු ලබන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් එකසිය අනූ දෙකෙහිම (192) මානව හිමිකම් වාර්තා සමාලෝචනයක් ඇතුළත් වන අසම සම ක්‍රියාවලියකි.

- විශ්ව කාලාන්තර සමාලෝචනය යනු තම රටවල මානව හිමිකම් තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ මානව හිමිකම් පිළිබඳ බැඳීම් ඉටු කිරීම සඳහා තමන් ගෙන ඇති ක්‍රියා මාර්ගයන් කවරේද යන්න ප්‍රකාශ කිරීම සඳහා සෑම රාජ්‍යයකටම අවස්ථාව සපයා දෙන රාජ්‍ය මගින් පාලනය වන ක්‍රියාවලියකි.

උදා:- ශ්‍රී ලංකාවේ පළමු වන විශ්ව කාලාන්තර වාර්තාව වර්ෂ 2008 දී අධීක්ෂණය කරන ලදී. මෙම වාර්තා සඳහා රජය මගින් ඉදිරිපත් කරන ලද වාර්තාව, එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතයන්හි තොරතුරු සමග සංසන්දනය කරන ලද මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයේ වාර්තාව, රාජ්‍ය නොවන ආයතනවල වාර්තා සහ රජයෙන් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමෙන් ලද පිළිතුරු යනාදී තොරතුරු පදනම් කර ගන්නා ලදී. ඒ අනුව නිර්දේශ 77ක් ශ්‍රී ලංකා රජයට නිකුත් ලදී. එයින් ශ්‍රී ලංකා රජය විසින් නිර්දේශ 52 ක් පිළිගන්නා ලද අතර 25ක් ප්‍රතික්ෂේප කරන ලදී.

ශ්‍රී ලංකාවේ දෙවන විශ්ව කාලාන්තර වාර්තාව 2012.11.01 දින අධීක්ෂණය කරන ලදී. ඉහත සඳහන් කරන ලද වාර්තාව සමග ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්වාධීන වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව නිර්දේශ 204 ක් රජය වෙත නිකුත් කර ඇත. ඉන් 113ක් පිළිගත් අතර 91ක් ප්‍රතික්ෂේප කරන ලදී.

## ඇ) විශේෂ ක්‍රියාපටිපාටි

- විශේෂ ක්‍රියාපටිපාටි යනු ලෝකයේ සියළුම ප්‍රදේශවලට අදාළව රට රටවලට විශේෂිත තත්ත්වයන් හෝ සුවිශේෂී තේමාත්මක ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මානව හිමිකම් කවුන්සිලය විසින් පිහිටුවා ඇති යාන්ත්‍රණයකි.

- විශේෂිත ක්‍රියා පටිපාටීන් විශේෂ වාර්තාකරුවෙකු, ස්වාධීන විශේෂඥයෙකු වැනි තනි පුද්ගලයෙකු හෝ සාමාන්‍යයෙන් සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත ක්‍රියාකාරී මණ්ඩලයක් මගින් සිදු කරනු ලැබේ.

- මෙම විශේෂ ක්‍රියා පටිපාටීන් යටතේ බලතල දරන්නන්ට විශේෂිත රටවල හෝ භූමි ප්‍රදේශ තුළ සිදුවන හෝ විශේෂිත කෙටුම්පත් පිළිබඳව හෝ මානව හිමිකම් තත්ත්වයන් පිළිබඳ පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම, උපදෙස් දීම සහ ප්‍රසිද්ධියේ වාර්තා කිරීම සඳහා බලය ලැබේ.

උදා :- ළමයින් යුද්ධයට බඳවා ගැනීම
වධ හිංසා පැමිණවීම ආදී වශයෙනි

### විශේෂ ක්‍රියාපටිපාටීන් යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

- තනි පුද්ගලයින්ගෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීම
- අධ්‍යයනයන් පැවැත්වීම
- රට රටවල් මට්ටමෙන් තාක්ෂණික සහයෝගය පිළිබඳ උපදෙස් ලබාදීම
- සාමාන්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල නිරත වීම

## 1.1.4 ජාත්‍යන්තර අධිකරණය (International Court of Justice)

ජාත්‍යන්තර අධිකරණය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධානතම නියෝජිතායතනය වේ. එය 1945 වර්ෂයේ ජුනි මාසයේ දී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබීය. මෙම අධිකරණයට ද්විත්ව අධිකරණ බලයක් හිමි වේ. අධිකරණය විනිසුරුවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත වේ.

රාජ්‍යයන් විසින් මෙම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන නීතිමය ආරවුල් ජාත්‍යන්තර නීතියට අනුකූලව විසදීම සහ බලයලත් එක්සත් ජාතීන්ගේ නියෝජිත

ආයතන සහ විශේෂ නියෝජිත ආයතන විසින් එය වෙත යොමු කරනු ලබන නීතිමය ප්‍රශ්න සඳහා උපදේශාත්මක අදහස් ලබා දීම ද මෙම අධිකරණයේ කාර්යභාරය වේ.



**ඡායාරූප 3 : ජාත්‍යන්තර අධිකරණය**

## 1.2 ගිවිසුම් පදනම් කරගත් මානව හිමිකම් යාන්ත්‍රණ

රාජ්‍යයන් විසින් අන්තර්ජාතික මානව හිමිකම් ගිවිසුම් යටතේ ඒවායේ අන්තර්ජාතික බැඳීම් පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ පෙළඹවීම සඳහා ගිවිසුම් සංවිධාන නිර්මාණය කරන ලදී.

ගිවිසුම් සංවිධාන ස්වාධීන විශේෂඥයින්ගෙන් සමන්විත වේ. මානව හිමිකම් ක්ෂේත්‍රයේ නිපුණත්වය, උසස් ලෙස පිළිගත් කීර්තිනාමය සහ පිළිගත් අපක්ෂපාතීභාවය යන ගති ලක්ෂණ ඔවුන් සතු වේ.

ගිවිසුම් සංවිධානයෙන් සංවිධානයට සාමාජිකයින් සංඛ්‍යාව වෙනස් වේ. අංක 01 වගුවේ ගිවිසුම් සංවිධාන පිළිබඳ විස්තර සඳහන් කර ඇත.

| මානව හිමිකම් ගිවිසුම් අධීක්ෂණ සංවිධානය | ගිවිසුම | පිහිටවූ වර්ෂය | සාමාජික සංඛ්‍යාව | නියමිත කාලයට සිදුවන වාර්තා කිරීම | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මූලික වාර්තාව | කාලාන්තර වාර්තාව | වසරකට සැසි සංඛ්‍යාව | කාලය | කාල පරිච්ඡේදය | ස්ථානය |
| වාර්ගික වෙනස්කොට සැළකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව (CERD) | ICERD | 1990 | සාමාජිකයින් 18 | අවුරුදු 01 | අවුරුදු 02 | සැසි 02 | එකක් සති 03 බැගින් | පෙබරවාරි අගෝස්තු | ජිනීවා |
| ආර්ථිකණී සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CESCR) | ICESCR | 1987 | සාමාජිකයින් 18 | අවුරුදු 02 | අවුරුදු 05 | සැසි 02 | සති 03 සැසියකට සති 01 බැගින් | මැයි නොවැම්බර් | ජිනීවා |
| මානව හිමිකම් කමිටුව (HRC) | ICCPR | 1976 | සාමාජිකයින් 18 | අවුරුදු 01 | අවුරුදු 04 | සැසි 03 | එකක් සති 03 බැගින් | මාර්තු ජූලි නොවැම්බර් | නිව්යෝර්ක් ජිනීවා |
| කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැළකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව (CEDAW) | CEDAW | 1982 | සාමාජිකයින් 23 | අවුරුදු 01 | අවුරුදු 04 | සැසි 02 | එකක් සති 03 බැගින් | ජනවාරි ජූලි | නිව්යෝර්ක් ජිනීවා |
| වධහිංසාවට එරෙහි කමිටුව (CAT) | CAT | 1982 | සාමාජිකයින් 10 | අවුරුදු 01 | අවුරුදු 04 | සැසි 02 | එකක් සති 03 බැගින් | මැයි නොවැම්බර් | ජිනීවා |
| ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CRC) | CRC<br>CRC<br>OPSC<br>CRC<br>OPAC | 1990 | සාමාජිකයින් 18 | අවුරුදු 02<br>අවුරුදු 02<br><br>අවුරුදු 02 | අවුරුදු 05<br>අවුරුදු 05 / මීළඟ CRC වාර්තාව සමග<br>අවුරුදු 05 / මීළඟ CRC වාර්තාව සමග | සැසි 03 | එකක් සති 03 බැගින් | ජනවාරි මැයි සැප්තැම්බර් | ජිනීවා |
| සංක්‍රමණික සේවකයින් පිළිබඳ කමිටුව (CMW) | ICRMW | 2004 | සාමාජිකයින් 10 | අවුරුදු 01 | අවුරුදු 05 | සැසි 02 | සති 01 | අප්‍රේල්, නොවැම්බර් දෙසැම්බර් | ජිනීවා |
| ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CRPD) | ICRPD | 2006 | සාමාජිකයින් 18 | අවුරුදු 02 | අවුරුදු 04 | සැසි 02 | සති 01 | අප්‍රේල් සැප්තැම්බර් | ජිනීවා |
| බලහත්කාරයෙන් සිදු කරන අතුරුදහන් කිරීම පිළිබඳ කමිටුව (CED) | ICED | 2006 | සාමාජිකයින් 10 | අවුරුදු 02 | අවුරුදු 02 | සැසි 02 | සති 01 | නියමිත සැලැස්ම වෙනස්කම් වලට යටත් වේ | ජිනීවා |

වගුව 01 ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම අධීක්ෂණ සංවිධානවල තොරතුරු

### 1.2.1 ගිවිසුම් සංවිධාන විසින් සිදු කරනු ලබන්නේ කුමක්ද ?

- රාජ්‍ය පාර්ශවයන් විසින් ගිවිසුම් ක්‍රියාත්මක කරනු ලබන්නේ කෙසේද යන්න අධීක්ෂණය කිරීම,

- රාජ්‍ය පාර්ශවයන් විසින් නිතිපතා ඉදිරිපත් කරනු ලබන වාර්තා ලබා ගැනීම සහ සළකා බැලීම.
- වාර්තා සකස් කිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන්ට උපකාර කිරීම පිණිස උපදෙස් නිකුත් කිරීම.
- ගිවිසුම්වල ඇති විධිවිධානවල අර්ථය පැහැදිලි කරමින් පොදු අර්ථ නිරූපනය විස්තර කර දැක්වීම.
- ගිවිසුම්වලට අදාළ තේමාවන් යටතේ සාකච්ඡා සංවිධානය කිරීම.
- ගිවිසුම්වල රාජ්‍ය පාර්ශවයන් විසින් එම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම.
- රාජ්‍ය පාර්ශවයන් විසින් යම් ක්‍රියා පටිපාටියක් තෝරාගෙන තිබේනම්, තමන්ගේ මානව හිමිකම් උල්ලංඝනය වූ බවට රජයන්ට චෝදනා කරමින් තනි පුද්ගලයින්ගෙන් ලැබෙන පැමිණිලි සහ ලිපි සළකා බැලීම.

### 1.2.2 මානව හිමිකම් ගිවිසුම් සංවිධාන - පැමිණිලි ක්‍රියා පටිපාටීන්

මානව හිමිකම් ගිවිසුම් සංවිධාන වෙත මානව හිමිකම් ගිවිසුම්වල ඇති විධිවිධාන උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ප්‍රධාන ක්‍රියා පටිපාටි 03 ක් තිබේ.

- තනි පුද්ගල සංදේශ
- රාජ්‍යයකින් රාජ්‍යයකට පැමිණිලි කිරීම
- විමසීම් කිරීම

එවැනි පැමිණිලි සළකා බැලීම සඳහා සියළුම කමිටුවලට අයිතියක් නොමැත.

### 1.2.3 තනි පුද්ගල සන්දේශ

මානව හිමිකම් ගිවිසුම් සංවිධාන වලින් පහක් (දේශපාලන සහ සිවිල් අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CCPR), වාර්ගික වෙනස්කොට සැළකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව (CERD), වධහිංසාවලට එරෙහි කමිටුව (CAT), කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැළකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව (CEDAW), සහ ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CRPD)) විශේෂ අවස්ථා යටතේ තනි පුද්ගල සංදේශ හෝ තනි පුද්ගලයින්ගෙන් ලැබෙන ලිපි සළකා බලයි. ගිවිසුම් සංවිධාන ක්‍රියාකාරීත්වය පිළිබඳව කරුණු සඳහන් කරයි.

| මානව හිමිකම් කමිටුව | පැමිණිලි කිරීමේ ක්‍රියා පටිපාටිය |
|---|---|
| මානව හිමිකම් කමිටුව (HRC) | සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ පළමු වෛකල්පික සන්ධානය රාජ්‍ය පාර්ශවයන්ට අදාළ තනි පුද්ගල සංදේශ සළකා බලනු ඇත. |
| කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැළකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව (CEDAW) | කාන්තාවන්ට වෙනස් ආකාරයෙන් සැළකීම තුරන් කිරීම සඳහා වන සම්මුතියේ පළමු වෛකල්පික සන්ධානය රාජ්‍ය පාර්ශවයන්ට අදාළ තනි පුද්ගල සංදේශ සළකා බලනු ඇත. |
| වධහිංසාවට එරෙහි කමිටුව (CAT) | වධහිංසාවට එරෙහි සම්මුතියේ 22 වැනි වගන්තිය යටතේ අවශ්‍ය ප්‍රකාශයන් සිදු කර ඇති රාජ්‍ය පාර්ශවයන්ට අදාළ තනි පුද්ගල සංදේශ සළකා බලනු ඇත. |
| වාර්ගික වෙනස් කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව (CERD) | වාර්ගිකව වෙනස් ආකාරයෙන් සැළකීම තුරන් කිරීම සඳහා වන සම්මුතියේ 14 වැනි වගන්තිය යටතේ අවශ්‍ය ප්‍රකාශයන් සිදු කර ඇති රාජ්‍ය පාර්ශවයන්ට අදාළ තනි පුද්ගල සංදේශ සළකා බලනු ඇත. |
| ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CRPD) | ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි පළමු වෛකල්පික සන්ධානය රාජ්‍ය පාර්ශවයන්ට අදාළ තනි පුද්ගල සංදේශ සළකා බලනු ඇත. |
| සංක්‍රමණික සේවකයින් පිළිබඳ කමිටුව (CMW) | තනි පුද්ගල සංදේශ සළකා බැලීමට ඉඩ දීම සඳහා වන විධි විධාන අඩංගු වේ. 77 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පාර්ශවයන් 10 ක් අවශ්‍ය ප්‍රකාශයන් සිදු කර ඇති විට මෙම විධි විධාන ක්‍රියාත්මක වේ. |

වගුව 02 : පැමිණිලි කිරීමේ ක්‍රියාපටිපාටිය

### 1.2.4 පැමිණිලි ඉදිරිපත් කළ හැක්කේ කවුරුන් විසින්ද?

ප්‍රඥප්තිය හෝ සම්මුතිය යටතේ ගිවිසුමක රාජ්‍ය පාර්ශවය විසින් තම හිමිකම් උල්ලංඝනය කරනු ලැබුවේ යැයි කියන ඕනෑම පුද්ගලයෙකුට, රාජ්‍ය පාර්ශවය විසින් අදාළ කමිටුවට එම පැමිණිලි භාර ගැනීම සඳහා ඇති යෝග්‍යතාවය පිළිගෙන තිබේ නම්, අදාළ කමිටුව වෙත සංදේශයක් ඉදිරිපත් කළ හැක.

පුද්ගලයෙකු විසින් තම කැමැත්ත ලිඛිතව ලබා දී ඇති අවස්ථාවක හෝ පුද්ගලයෙකු එසේ තම කැමැත්ත ලබා දිය නොහැකි තත්ත්වයක සිටින අවස්ථාවක, එම පුද්ගලයා වෙනුවෙන් තුන්වන පාර්ශවයකට පැමිණිලි ඉදිරිපත් කළ හැක.

### 1.2.5 ඔබගේ පැමිණිල්ල මගින් ලබා දිය යුතු තොරතුරු මොනවාද?

එය යම් විශේෂ ස්වරූපයක් ගැනීම අවශ්‍ය නොවේ, අවශ්‍ය තොරතුරු සපයා දෙන ඕනෑම ලිපියක් ප්‍රමාණවත් වේ.

- ඔබගේ හිමිකම් පෑම ලිඛිතව සහ අත්සන් යොදා තිබිය යුතුයි.
- එහි මූලික පෞද්ගලික තොරතුරු සපයා තිබිය යුතුයි - ඔබගේ නම, ජාතිකත්වය සහ උපන් දිනය
- ඔබගේ පැමිණිල්ල ඉදිරිපත් කරනු ලබන්නේ කුමන රාජ්‍ය පාර්ශවයකට එරෙහිව ද යන්න නිශ්චිතව සඳහන් කරන්න.
- ඔබ වෙනත් පුද්ගලයෙකු වෙනුවෙන් පැමිණිල්ල ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඉහත සඳහන් කළ පරිදි, එසේ කිරීම සඳහා ඔබට එම පුද්ගලයාගේ කැමැත්ත ලබා දීම සනාථ කළ යුතුය, නැතහොත් එම පුද්ගලයාට එසේ කැමැත්ත ලබා දීමට නොහැකි මන්දැයි පැහැදළිව සඳහන් කළ යුතුයි.

### 1.2.6 සංදේශයෙහි පිළිගත හැකි බව

පිළිගත හැකි බව පරීක්ෂා කිරීමේ දී කමිටුව විසින් පහත සඳහන් සාධකවලින් එකක් හෝ කිහිපයක් සැළකිල්ලට ගත හැකිය.

- යම් පුද්ගලයෙකු වෙනත් පුද්ගලයෙකු වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම්, ඔවුන්ට ඒ සඳහා ප්‍රමාණවත් අවසර දීමක් ලබාගෙන තිබේද, නැතහොත් ඔවුන් විසින් ක්‍රියා කිරීම සාධාරණීකරණය කර තිබේද ?

- වින්දිතයෙකු විසින් තමාගේ අයිතිවාසිකම් උල්ලංඝන කළේ යැයි හෝ කරමින් සිටී යැයි රටකට විරුද්ධව පැමිණිලි කරන විට එම රාජ්‍ය පාර්ශවයේ නීතිය, ප්‍රතිපත්තිය, ක්‍රියාමාර්ගය, ක්‍රියාව හෝ බැහැර කිරීම තමාට පෞද්ගලිකව සහ සෘජුවම බලපාන බවට එම වින්දිතයා විසින් පෙන්වා දිය යුතුයි.

- චෝදනා කරනු ලබන උල්ලංඝනය කිරීම ගිවිසුම මගින් සත්‍ය වශයෙන්ම ආරක්ෂා කරනු ලබන අයිතිවාසිකමකට අදාළ විය යුතුයි.

- ප්‍රඥප්තිය උල්ලංඝනයවීමක් සිදු වූ බවට ඉදිරිපත් කරන ඔබගේ පැමිණිල්ල හෝ තර්ක සඳහා ප්‍රමාණවත් තරම් කරුණු ඉදිරිපත් කර නැතැයි අදාළ කමිටුව සළකන්නේ නම්, සෑම පැත්තක්ම සළකා බැලීමට පෙර, තොරතුරු පදනම්කර ගෙන, පිළිගත හැකි වීමට ප්‍රමාණවත් ලෙස සනාථ කර නොමැති ලෙස සළකා එම හිමිකම් පෑම ප්‍රතික්ෂේප කළ හැක.

- නීතියක් හැටියට, පැමිණිලි කිරීමේ යාන්ත්‍රණය බල පැවැත්වීමට පටන් ගත් කාලයට පෙර කාල පරිච්ඡේදයක් දක්වා තරම් පැරණි කාලයක පැමිණිලි කමිටුව විසින් පරීක්ෂා කරනු නොලබයි.

- කමිටුවකට පැමිණිල්ලක් ගෙන ඒමට පෙර, පොදුවේ ඔබගේ රාජ්‍යයේ දී යොදා ගත හැකි සියලුම පිළියම් යොදා තිබිය යුතු වීම පැමිණිල්ලක් පිළිගත හැකි වීමට බලපවත්වන ඉතා වැදගත් ප්‍රතිපත්තියකි.

- කලාතුරකින් ඇතිවන අවස්ථාවල, පැමිණිල්ලක් නිස්සාර, කටයුතු කිරීමට අපහසු කරවන තරම් තරහ උපදවන, එසේ නැතහොත් පැමිණිලි කිරීමේ පටිපාටිය අනිසි ලෙස යොදාගැනීමක් සේ සළකා කමිටුව විසින් එය පිළිගත නොහැකි පැමිණිල්ලක් ලෙස ප්‍රතික්ෂේප කළ හැක.

- යම් පැමිණිලිකරුවෙක් එකම ඉල්ලීම තවත් ගිවිසුම් සංවිධානයකට හෝ ප්‍රාදේශීය යාන්ත්‍රණයකට ඉදිරිපත් කර ඇත්නම් එම පැමිණිල්ල විභාග කිරීමට කමිටුවට නොහැක.

- සමහර සංදේශයන් පිළිබඳ පරීක්ෂා කිරීමට කමිටුවට ඇති බලතල සීමා කරමින් යම් රාජ්‍යයක් විසින් පැමිණිලි කිරීමේ යාන්ත්‍රණයට ක්‍රියාපටිපාටිමය නියමයන් ඇතුළත් කර තිබිය හැක.

ශ්‍රී ලංකාවෙන් මානව හිමිකම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි කිහිපයක් වගුව 3හි දක්වා ඇත.

| පැමිණිලි පාර්ශවය | විෂයානුබද්ධ ගැටළුව | සම්මුතියේ වගන්ති | මානව හිමිකම් කමිටුව විසින් හඳුනාගන්නා ලද උල්ලංඝනය වූ වගන්ති |
|---|---|---|---|
| වික්ටර් අයිවන් 909/2002 | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස | 2(3), 3, 19, 26, 14 (3) (ජ) | ◆ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස - 19<br>◆ ප්‍රමාදයෙන් තොරව නඩු කටයුතු පවත්වාගෙන යාම |
| ඇන්තනී මයිකල් ඉමානුවෙල් ප්‍රනාන්දු 1189/2003 | අපක්ෂපාතී විනිශ්චය සභාවක් තුලින් තම ගැටළුවට සහන ලබා ගැනීමට නොහැකිවීම පිළිබද | 7, 9, 10 (1), 14 (1), (2), ((3) (a,b,c,d)) , (5)19 (2), (3) | ◆ පුද්ගල ආරක්ෂාවට සහ නිදහස ඇති අයිතිවාසිකම<br>◆ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම - (9(1)) |
| එස් බී දිසානායක 1373/2005 | අධිකරණය එරෙහි අපහාසකිරීම සම්බන්ධයෙන් දුන් තීන්දුවට එරෙහිව අභියාචනා කිරීමට නොහැකිවීම පිළිබඳව | 7, 8 (3) ඕ), 9(1), 14 ((2)(3):(a) (e) & (g)) (5), 15(1), 19,(3), 25, (ඉ), 26 | ◆ පුද්ගල ආරක්ෂාවට සහ නිදහස ඇති අයිතිවාසිකම<br>◆ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම (9(1))<br>◆ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස (19) |
| එස්. ජෙගදීස්වර සර්මා 950/2000 | රඳවා තබාගැනීමේදී අවමන් සහගත සැලකීම, උසාවි නඩු කටයුතුවලට අපහාස කිරීමේ වරදට රඳවා තබා ගැනීම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම | 6,7,9,10 | ◆ වධහිංසවෙන් තොරවීමේ නිදහස (7)<br>◆ පුද්ගල ආරක්ෂාවට සහ නිදහස ඇති අයිතිවාසිකම(9) |
| ජයලත් ජයවර්ධන 916/2000 | රජයේ ප්‍රධානියා සම්බන්ධයෙන් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීමෙන් පසු මරණීය තර්ජන එල්ලවීම | 9(1) | පුද්ගල ආරක්ෂාවට සහ නිදහස ඇති අයිතිවාසිකම |

වගුව 03 : ශ්‍රී ලංකාව මානව හිමිකම් කමිටුව වෙත ඉදිරිපත් කළ පැමිණිලි

## 1.2.7 අන්තර රාජ්‍ය පැමිණිලි

බොහෝ මානව හිමිකම් ගිවිසුම්වල එක් රාජ්‍ය පාර්ශවයක් විසින් සිදු කරනු ලැබ ඇතැයි කියනු ලබන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ ආදාළ ගිවිසුම් සංවිධානය වෙත පැමිණිලි කිරීම සඳහා තවත් රාජ්‍ය පාර්ශවයකට ඉඩ ලබා දීම සඳහා අවශ්‍ය විධි විධාන ඇතුළත් වේ. වගුව 04 මගින් අන්තර රාජ්‍ය පැමිණිළි පිළිබඳව කරුණු දක්වයි.

| ගිවිසුම් සංවිධානය | අන්තර රාජ්‍ය පැමිණිලි කිරීමේ ක්‍රියා පටිපාටිය |
|---|---|
| වධහිංසා වලට එරෙහි කමිටුව සහ සංක්‍රමණික සේවකයින් පිළිබඳ කමිටුව | වධහිංසාවලට එරෙහි සම්මුතියේ 21 වැනි වගන්තිය සහ සංක්‍රමණික සේවකයින් පිළිබඳ සම්මුතියේ 74 වැනි වගන්තිය මගින් එක් රාජ්‍ය පාර්ශවයක් විසින් සම්මුතියේ විධිවිධාන ක්‍රියාත්මක නොකරන බවට තවත් රාජ්‍ය පාර්ශවයකට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි පිළිබඳ අදාළ කමිටුව විසින්ම සළකා බැලීම සඳහා ක්‍රියාපටිපාටියක් සකස් කර තිබේ. |
| වාර්ගික වෙනස් කොට සැළකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව සහ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ කමිටුව | වාර්ගික වෙනස්කොට සැළකීම තුරන් කිරීම පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 11 - 13 දක්වා වගන්තිවල සහ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 41-43 දක්වා වගන්ති මගින් රාජ්‍යයක් විසින් අදාළ සම්මුතීන් යටතේ ඇති බැඳීම් ඉටු නොකිරීම හේතුවෙන් රාජ්‍ය පාර්ශවයන් අතර ඇතිවන ගැටුම් විසඳීම පිණිස තත් කාර්යය සඳහා කොමිසමක් ස්ථාපිත කිරීමට අවශ්‍ය වන විස්තරාත්මක විධිවිධාන දක්වා තිබේ. |
| කාන්තාවට එරෙහි වෙනස්කොට සැළකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව, වධහිංසාවලට එරෙහි කමිටුව සහ සංක්‍රමණික සේවකයින් පිළිබඳ කමිටුව | කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැළකීම තුරන් කිරීමේ සම්මුතියේ 29 වගන්තිය, වධහිංසාවලට එරෙහි සම්මුතියේ 30 වැනි වගන්තිය සහ සංක්‍රමණික සේවකයින් පිළිබඳ සම්මුතියේ 92 වැනි වගන්තිය මගින් සම්මුතීන් අර්ථ නිරූපණය කිරීම හෝ ඒවා යොදාගැනීමට අදාළව රාජ්‍ය පාර්ශවයන් අතර ඇති වන ගැටුම් පළමු අවස්ථාවේ දී සාකච්ඡා මාර්ගයෙන් ද, එසේ අපොහොසත් වුවහොත් බේරුම්කරණය මගින් ද විසඳා ගැනීමට අවශ්‍ය විධිවිධාන සලසා තිබේ. |

## 1.2.8 විමසීම් කිරීම්

වධ හිංසාවලට එරෙහි කමිටුව සහ කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැළකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව වෙත රාජ්‍ය පාර්ශවයන් විසින් තද බල ලෙස හෝ ක්‍රමාණුකූලව සම්මුතිය උල්ලංඝනය කරනු ලබන බව සත්‍ය ලෙස පිළිගත හැකි කරුණු ඇතුළත් විශ්වාසය තැබිය හැකි තොරතුරු ලැබී තිබේ නම් ඔවුන්ගේ තීරණය මත ඔවුන් විසින්ම විමර්ශන සිදු කිරීම ආරම්භ කළ හැකිය.

## 1.3 වෙනත් අන්තර්ජාතික යාන්ත්‍රණ

### 1.3.1 මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය

1993 ඔස්ට්‍රේලියාවේ වියානා නුවර පැවති ලෝක සමුළුවේ දී සාමාජික රටවල යෝජනා සම්මුතියකින් මහා මණ්ඩලය මගින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහකොමසාරිස් කාර්යාලය ආරම්භ කරන ලදී.

ලෝක ප්‍රජාව වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ සඳහන් අයිතීන් හා අනෙක් ජාත්‍යන්තර මානව හිමිකම් නීති සහ සම්මුතීන් හි සඳහන් අයිතිවාසිකම් වලට ගරු කිරීම, වර්ධනය කිරිම හා ආරක්ෂා කිරීම මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයෙන් සිදු වේ.



**ඡායාරූප 4 : එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාල සංකීර්ණය - ජිනීවා**

මෙහිදී මානව හිමිකම් උල්ලංඝනයන් වැළැක්වීම මානව හිමිකම් ආරක්ෂා කිරීමේ අන්තර් ජාතික සහයෝගය ප්‍රවර්ධනය කිරීම හා මානව හිමිකම් හා සබැඳි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සියළු කාර්යන් ශක්තිමත් කිරීම හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමද මහ කොමසාරිස් කාර්යාලය මගින් සිදු වේ.

මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් එක්සත් ජාතීන්ගේ ප්‍රධාන මානව හිමිකම් නිලධාරියා හා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් කාර්යාලයේ ප්‍රධානියා ද වේ. එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය මානව හිමිකම් තත්ත්වයන් නගා

සිටුවීමට දේශීය මට්ටමින් රටවල් සමගත් සිවිල් සංවිධාන සමගත් එක්සත් ජාතීන්ගේ ආයතන සමගත් කටයුතු කරනු ලබයි.

එක්සත් ජාතීන්ගේ සංවිධාන පද්ධතිය තුළ ඇති විවිධ මානව හිමිකම් අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණ සඳහා මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය මගින් සහයෝගය ලබා දෙනු ලබයි. ඊට අමතරව මානව හිමිකම් අධ්‍යාපනය සහ සම්පත් සම්පාදනය කරනු ලබන අතර ජාත්‍යන්තරව සහ දේශීය වශයෙන් මානව හිමිකම් වල වැදගත්කම තහවුරු කරනු ලබයි.

## 1.3.2 ජාත්‍යන්තර අපරාධ අධිකරණය (International Criminal Court)

රෝම ව්‍යවස්ථාව මගින් පාලනය වන ජාත්‍යන්තර අපරාධ අධිකරණය, ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානයට ලක්වන ඉතාම බරපතල අපරාධකරුවන්ට එරෙහි දඬුවම් කිරීම සඳහා පිහිටුවන ලද ප්‍රථම ස්ථිර ගිවිසුම් පදනම් කර ගත් අධිකරණය වේ. ජන සංහාර, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ, යුධ අපරාධ සහ ආරවුල් සම්බන්ධ අපරාධ බරපතල අපරාධ වලට ඇතුළත් වේ. ඉහත අපරාධ සම්බන්ධයෙන් විමර්ශනය කර නඩු පවරා වරදකරුට දඬුවම් පැමිණවීම මේ ආයතනයේ ප්‍රධානම අරමුණ වේ.



**ඡායාරූප 5 : ජාත්‍යන්තර අපරාධ අධිකරණය**

ජාත්‍යන්තර අපරාධ අධිකරණය ප්‍රධාන කොටස් 04කින් සමන්විත වේ. එවා නම් ප්‍රධාන කාර්යාලය, නඩු කටයුතු සිදුකරන ස්ථානය, නඩු කටයුතු මෙහෙයවන්නන්ගේ කාර්යාලය සහ ලියාපදිංචි කරන කාර්යාලය (Registry). මේ කොටස් හතරටම විශේෂිත වූ කාර්යභාරයකින් සහ බලතල මගින් වැඩකටයුතු කරනු ලබයි.

ජාත්‍යන්තර අපරාධ අධිකරණයට යම් රටක බරපතල අපරාධ සම්බන්ධයෙන් අධිකරණ බලය යෙදවීමට හැකි වන්නේ ඒ රට විසින් රෝම ව්‍යවස්ථාවට අත්සන් කර පිළිගෙන ඇත්නම් පමණි. රෝම ව්‍යවස්ථාවට අත්සන් නොකළ යම් රටක වුවද බරපතල අපරාධ සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලය විසින් යෝජනා ඉදිරිපත් කරන්නේ නම් එම අපරාධ සම්බන්ධයෙන් අධිකරණ බලය යෙදවීමට ජාත්‍යන්තර අපරාධ අධිකරණයට හැකි වේ.

## 2.0 කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණ

මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර ක්‍රමවේදයෙහි ඉතා වැදගත් කොටස් කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණවල අඩංගු වේ. දැනට පවතින කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණ පහ ඉතා දියුණු මානව හිමිකම් යාන්ත්‍රණයක සිට හදිසි යාන්ත්‍රණයක් දක්වා වෙනස් වන යාන්ත්‍රණ ලෙස දැක්විය හැක.

- යුරෝපය
- අන්තර් ඇමරිකානු ක්‍රමය
- අප්‍රිකාව
- අරාබි ලෝකය /කම්ටුව
- අග්නිදිග ආසියානු ජාතීන්ගේ එකමුතුව (ASEAN)

මේ යාන්ත්‍රණයන් අතරින් යුරෝපීය යාන්ත්‍රණය ඉතා දියුණු මට්ටමක පවතී. උපකලාප වල මානව හිමිකම් යාන්ත්‍රණය ස්ථාපිත වෙමින් පවතී. උදාහරණයක් වශයෙන් සාර්ක් සංවිධානය විශේෂයෙන් දැක්විය හැකිය.

වගුව 05 මානව හිමිකම් සම්බන්ධ කළාපීය යාන්ත්‍රණ දක්වා ඇත.

| කලාපය | සංවිධානය | කෙටි විස්තරයක් |
| --- | --- | --- |
| අප්‍රිකානු කලාපය | මානව හිමිකම් සහ ජනතා අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු කොමිසම | එය අප්‍රිකානු ප්‍රඥප්තියට අනුව නිර්මාණය කර තිබේ. අප්‍රිකාව තුළ මානව හිමිකම් සහ ජනතාවගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ඒවා ආරක්ෂා කිරීම තහවුරු කිරීම මෙම කොමිසමේ ප්‍රධාන ක්‍රියාකාරිත්වය වේ. බරපතල මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳව එය වැඩි අවධානයක් යොමු කරයි. |
| | මානව හිමිකම් සහ ජනතා අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු අධිකරණය. | මානව හිමිකම් පිළිබඳ අප්‍රිකානු අධිකරණයක් පිහිටුවීම වර්ෂ 1998 දී ප්‍රඥප්තියේ මුල් කෙටුම්පත මගින් පිළිගෙන තිබේ. |
| ඇමරිකානු කලාපය | මානව හිමිකම් පිළිබඳ අන්තර් ඇමරිකානු කොමිසම | පවතින තොරතුරු භාවිතා කරමින් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් තත්ත්වයන්ට ප්‍රතිකර්ම යෙදීම පිණිස අදාළ රාජ්‍යයන්ට පීඩනයක් ඇති කිරීම සඳහා බරපතල සහ ක්‍රමානුකූල මානව හිමිකම් උල්ලංඝනයවීම් ගණනාවක් එය විසින් ලේඛන ගත කර තිබේ. |
| | අන්තර් ඇමරිකානු අධිකරණය | තනි පුද්ගල පැමිණිලි පිළිබඳ නිශ්චය කිරීම සඳහා හැකියාව පවතී. මෙම අධිකරණයට උපදේශක සහ විනිශ්චය ලබා දීමේ යන අධිකරණ බලතල දෙකම තිබේ. |
| | අන්තර් ඇමරිකානු කාන්තා කොමිසම | කාන්තාවන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම, සහ සමාජයේ සෑම ක්ෂේත්‍රයකම පිරිමින් සහ කාන්තාවන්ගේ සහභාගීත්වයේ සමානත්වය වැඩිකිරීම මෙම කොමිසමේ මෙහෙවර වේ |

| | | |
|---|---|---|
| යුරෝපා කලාපය | යුරෝපා සභාව | කලාපීය මට්ටමේ වඩාත් දියුණුම මානව හිමිකම් ආරක්ෂණ පද්ධතිය එය සතු වේ.<br><br>තීරණ ක්‍රියාත්මක කිරීමේ දී ඉහළ මට්ටමේ සාර්ථකවයක් සහිත අධිකරණ අංගයකි. |
| | මානව හිමිකම් පිළිබඳ යුරෝපා අධිකරණය<br>මානව හිමිකම් පිළිබඳ යුරෝපා කොමසාරිස් | 1999 දී පිහිටුවන ලද නව සංවිධානයකි. සාමාජික රටවල මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනය සහ දැනුවත් බව ප්‍රවර්ධනය කිරීම කොමසාරිස්වරුන්ගේ අරමුණ වේ. එමෙන්ම ඵලදායී ලෙස මානව හිමිකම් පිළිපැදීම සහ පූර්ණ ලෙස විහරණය කිරීම භුක්ති විදීම සඳහා ද උපකාරී වේ. |
| | මානව හිමිකම් පිළිබඳ යුරෝපා කොමිසම | තමන්ගේ මානව හිමිකම් උල්ලංඝනය වූ බවට ප්‍රකාශ කරමින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීම සඳහා මුල්ම යුරෝපා සම්මුතිය යටතේ එය පිහිටවනු ලැබීය. |
| | සාධාරණත්වය සහ මානව හිමිකම් පිළිබඳ යුරෝපා අධිකරණය | සාමාජික රාජ්‍යයන්හි පුරවැසියන්ගේ අයිතිවාසිකම් සමග සමාජ නීතියේ ඇති විධි විධාන සමාදානය කිරීම සිදු කරයි. |
| අරාබි ලෝකය | අරාබි මානව හිමිකම් කමිටුව | මෙම ආයතනය 2009 වර්ෂයේ දී පිහිටුවා ඇත. මෙම කමිටුව අරාබි මානව හිමිකම් ප්‍රතිපත්තිය අධීක්ෂණය කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. |
| අග්නිදිග ආසියානු කලාපය | අග්නිදිග ආසියානු ජාතීන්ගේ එකමුතුවේ අභ්‍යන්තර රාජ්‍ය මානව හිමිකම් කොමිෂන් සභාව | අග්නිදිග ආසියානු ජාතීන්ගේ එකමුතුවේ ප්‍රඥප්තියේ 14 වන ව්‍යවස්ථාව අනුව පිහිටුවා ඇත. |

## 3.0 ජාතික මානව හිමිකම් යාන්ත්‍රණය

ජාතික මානව හිමිකම් යාන්ත්‍රණ, මූලික අයිතිවාසිකම් පදනම් කරගත් ආයතන සහ මූලික අයිතිවාසිකම් පදනම් කර නොගත් ආයතන යනුවෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය.

## 3.1 මූලික අයිතිවාසිකම් පදනම් කරගත් යාන්ත්‍රණයන්

මූලික අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා සහ එම අයිතිවාසිකම් උල්ලංඝනයවීම වලදී ඒවා ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ප්‍රධාන ආයතන පහත දක්වා ඇත.

- ශ්‍රේෂ්ඨාධිකරණය
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)

### 3.1.1 ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය

ඉහළම සහ අවසාන අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණය වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානයන්ට යටත්ව එහි බලතල ක්‍රියාත්මක කිරීමට බලය ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු විනිශ්චයකාරවරුන් එකොළොස් දෙනෙකුගෙන් (11) සමන්විත වේ.



ඡායාරූප 6 : ශ්‍රේෂ්ඨාධිකරණය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 118 වැනි ව්‍යවස්ථාව මගින් පහත අධිකරණ බලයන් ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දී ඇත.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ ගැටළු වල දී
- මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන්
- අවසාන අභියචනාධිකරණ බලය
- අධිකරණ බලතල සංස්ථාපනය කිරීම
- මැතිවරණ පෙත්සම්වල දී (ජනාධිපතිවරණය)
- ඕනෑම පාර්ලිමේන්තු වරප්‍රසාද කඩවීමක් සම්බන්ධයෙන්
- පාර්ලිමේන්තුව විසින් නීතියෙන් පවරනු ලබන හෝ නියම කරනු ලබන වෙනත් කාරණා සම්බන්ධයෙන්
- නීතිඥයින් පිළිගැනීම, බඳවා ගැනීම, සේවය අත්හිටුවීම, සහ නැවත අලුත් කිරීම

විධායක හෝ පරිපාලන ක්‍රියාවක් නිසා මූලික අයිතිවාසිකමක් උල්ලංඝනයවීමක් හෝ උල්ලංඝනයවීමට අත්‍යාසන්න අවස්ථාවක දී යම් පුද්ගලයෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් සහනයක් ලබා ගත හැකි බවට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1978) 17 වැනි ව්‍යවස්ථාවේ විධි විධාන සලසා ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි ව්‍යවස්ථාවෙන් මූලික අයිතිවාසිකම් අධිකරණ බලය සහ එම බලතල යෙදවීමට විධි විධාන සලසා ඇත.

## අ) විධිමත් පැමිණිලි කිරීමේ ක්‍රමය

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 (2) ව්‍යවස්ථාව යටතේ අයිතිවාසිකම කඩවූ පුද්ගලයා හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයකු මගින් ශ්‍රේෂ්ඨාධික-රණය වෙත මසක් ඇතුළත, තත්කාලයේ බලපවත්නා අධිකරණ රීති වලට අනුකූලව ලිඛිත පෙත්සමක් සහ දිවුරුම් පෙත්සමක් මගින් එවන් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් සහනයක් හෝ වන්දියක් ලබා දෙන ලෙස ඉල්ලම් කළ හැක. (මෙකී සීමාව නඩු තීන්දු මගින් යම් යම් අවස්ථාවලදී සීමාසහිත ලෙස වෙනස් කොට ඇත)

උදාහරණ: <u>ශ්‍රීයානි සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ (2003 2SLR 63) හා වැවලගේ රාණි ප්‍රනාන්දු (නැසීගිය ළමාහේවාගේ ලාල්ගේ බිරිඳ සහ තවත් අය එදිරිව ස්ථානභාර නිලධාරී සුළු අපරාධ අංශය සීදුව පොලිස් ස්ථානය (SC App. No. 700/2002)</u> යන නඩුවලදී වින්දිතයෙකුට පෞද්ගලිකව

අධිකරණයක පිහිට පැතිය නොහැකි අවස්ථාවලදී එනම් නිත්‍යානුකූල අත්අඩංගුවක සිටියදී සිදු වන වධහිංසාවල ප්‍රතිඵලයක් ලෙස මිය යන අයෙකුගේ නීත්‍යානුකූල උරුමකරුට හේ නීත්‍යානුකූල යැපෙන්නෙකුට අධිකරණය වෙත යෑමේ හැකියාව ලබා දී ඇත.

## ආ) අවිධිමත් පැමිණිලි කිරීමේ ක්‍රමය

- ගරු අග්‍රවිනිශ්චයකාරතුමා අමතා යොමු කරනු ලබන ලිපියක් මගින්
- ගරු අග්‍රවිනිශ්චයකාරතුමා විසින් බැලූ බැල්මට පෙනෙන මූලික අයිතිවාසිකම් කඩවීමක් තිබේ නම් අදාළ ලිපිය ශ්‍රේෂ්ඨාධිකරණ රීති 44 (7) (ආ) යටතේ නීතීඥ සංගමයට හෝ නීති ආධාර කොමිෂන් සභාව වෙත අවශ්‍ය පියවර ගැනීම සඳහා යොමු කරයි.

එවැනි ඉල්ලීමක් පිළිබඳ ක්‍රියා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පූර්ව අවසරයක් ලබා ගැනීමෙන් පසුව පමණක් එවැනි ඉල්ලීමක් පිළිබඳව ක්‍රියා කරගෙන යා හැක්කේය. අවස්ථාවෝචිත පරිදි අවසරය ප්‍රදානය කිරීම හෝ අවසරය දීම ප්‍රතික්ෂේප කිරීම හෝ විනිශ්චයකාරවරයන් දෙදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් කළ හැක්කේය.

ශ්‍රේෂ්ඨාධිකරණය මගින් මූලික අයිතිවාසිකම් පිළිබඳව ව්‍යවස්ථාවේ සඳහන් කරුණු පුළුල් ලෙස අර්ථ නිරූපණය කරමින් නඩු තීන්දු රාශියක් ලබා දී ඇත. එමගින් මූලික අයිතිවාසිකම් පිළිබඳව පුළුල් දෘෂ්ටියකින් සලකා බලා ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන්හි හා ප්‍රඥප්තීන්හි අදාළ විධි විධාන ද මෙරට නීති පද්ධතිය තුළට හඳුන්වා දීමට කටයුතු කර ඇත.

## 3.1.2 පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්(ඔම්බුඩ්ස්මන්)

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වගන්තිය යටතේ පරිපාලන කටයුතු සම්බන්ධ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා පත්කරනු ලැබේ. පාර්ලිමේන්තුව විසින් නීති ගත කර ඇති 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වැනි වගන්තිය අනුව ඔම්බුඩ්ස්මන් තනතුර ස්ථාපිත කිරීම සඳහා විවිධාන සළසා ඇත.

රාජ්‍ය නිලධාරියෙකු, හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ එවැනි වෙනත් ආයතනයක නිලධාරියෙකු විසින් හෝ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්

සම්බන්ධයෙන් අනාවරණය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විසින් පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ඕනෑම පෙත්සමක් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු කිරීමට 1981 අංක 17 දරන පනතේ 10 වැනි වගන්තිය මගින් විධිවිධාන සලසා තිබේ.

රජයේ නිලධාරියෙකු හෝ ප්‍රධාන පනතේ සඳහන් කර ඇති නිලධාරියෙකු විසින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකට හෝ අසාධාරණයකට ලක්වන ඕනෑම පුද්ගලයෙකුට සෘජුවම ඔම්බුඩ්ස්මන්වරයා වෙත පැමිණිලි කිරීම සඳහා 1991 අංක 08 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනතින් අවසර දී තිබේ.

තම අභිමතය පරිදි එවැනි පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයාට බලය තිබේ. කිසියම් ආකාරයක මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීමක් හෝ අසාධාරණයක් සත්‍ය වශයෙන්ම සිදු වී ඇත්නම් අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඔහු විසින් සිදු කරනු ලබයි. එයට අමතර ඔහු මහජන පෙත්සම් කාරක සභාව වෙත හෝ පාර්ලිමේන්තුව වෙත දැනුම් දීම ද සිදු කරයි.

ආයතන ප්‍රධානීන් ඔම්බුඩ්ස්මන්වරයා විසින් කරන ලද නිර්දේශ අනුගමනය නොකරන්නේ නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ලෙස ජනාධිවරයා වෙත හෝ පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමට ඔම්බුඩ්ස්මන්වරයාට හැක.

## 3.1.3 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත යටතේ රටතුළ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ස්වාධීන කොමිෂන් සභාවකි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සංශෝධනය අනුව කොමිෂන් සභාව පත්කර තිබේ. එහි කාර්යන් ඉටු කිරීම සඳහා එයට පුළුල් බලතල තිබේ.




**ඡායාරූප 7 : ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවට හිමි බලතල දක්වා ඇත.

i. මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම් පිළිබඳ විමර්ශනය කිරීම සහ විමසීම් කිරීම

ii. ඕනෑම අධිකරණයක විසඳීමට තිබෙන මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම් නඩුවක් සම්බන්ධයෙන්, එම අධිකරණයේ අවසරය ඇතිව, අධිකරණ කටයුතු සඳහා මැදිහත්වීම

iii. රඳවා ගැනීමේ ස්ථාන නිතිපතා පරීක්ෂා කිරීම මගින් රැඳවියන්ගේ සුභසාධනය අධීක්ෂණය කිරීම හා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම

iv. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිසම වෙත යොමු කරන ලද ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ විධි නියමයන් පරිදි පියවර ගැනීම

v. මානව හිමිකම් සම්බන්ධ ගැටළු පිළිබඳ පර්යේෂණ සිදු කිරීම භාරගැනීම සහ එවැනි පර්යේෂණවල ප්‍රතිඵල ජනතාව අතර ප්‍රචලිත කිරීම හා බෙදා හැරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

vi ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍යවන සහ සුදුසු වන අනෙකුත් සියළුම කාර්යන් සිදු කිරීම

කොමිෂන් සභාවේ කාර්යභාරය පනතේ 10 වන වගන්තිය යටතේ දක්වා ඇත.

i සියළුම රාජ්‍ය ක්‍රියා පටිපාටීන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් වලට අනුකූල වන බවට තහවුරු කිරීම

ii මූලික අයිතිවාසිකම් වලට අනුකූලව නීති සම්පාදනය, පරිපාලන විධි නියමයන් සහ ක්‍රියා පටිපාටීන් සකස් කිරීම සඳහා රජයට උපකාරී වීම සහ උපදෙස් දීම

iii මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නව තිබීම පිළිබඳව පැමිණිලි විභාග කිරීම, විමර්ශනය කිරීම, සමථ හා සමගි කිරීමෙන් ඒවා විභාග කිරීමට පියවර ගැනීම

iv ශ්‍රී ලංකාව එළඹ ඇති ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් බැඳීම් වලට අනුකූලව ජාතික නීති සහ පරිපාලන පරිචයන් සකස් කළ හැකි ආකාරය පිළිබඳ රජයට නිර්දේශ ලබා දීම.

v. අන්තර්ජාතික මානව හිමිකම් ගිවිසුම් සහ මානව හිමිකම් ක්ෂේත්‍රයේ ඇති වෙනත් අන්තර්ජාතික මෙවලම් පිළිගැනීම සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබා දීම.

vi. රට තුළ මානව හිමිකම් පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම

කොමිෂන් සභාව විමර්ශන හා පරීක්ෂණ, අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන්, අධීක්ෂණ සහ සමාලෝචන සහ පරිපාන හා මූල්‍ය යන ප්‍රධාන අංශ 4කින් සමන්විත වේ

අගතියට පත් පාර්ශවයට, කණ්ඩායමකට හෝ ඒ වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයකුට කොමිෂන් සභාව වෙත පැමිණිලි සිදු කළ හැකිය.

## 3.2 මූලික අයිතිවාසිකම් පදනම් කර නොගත් යාන්ත්‍රණයන්

### 3.2.1 නීති ආධාර කොමිෂන් සභාව (Legal Aid Commission)

1978 අංක 27 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවා ඇත. නීති ආධාර අවශ්‍ය පුද්ගලයින් වෙනුවෙන් කටයුතු කරයි. නිති ආධාර කොමිෂන් සභාව විසින් පහත සඳහන් ආධාර නොමිලේ සපයනු ලබයි.

- සිවිල් නඩු කටයුතු
- අපරාධ සම්බන්ධ නඩු කටයුතු
- ඇප නොගෙවීමේ දී සිරගත වන්නන්ට සහන ලබා ගැනීමට උසාවි නියෝජනය
- අයිතිවාසිකම් උල්ලංඝනයන් සම්බන්ධ නඩු (මානව හිමිකම් කාර්යයාංශය)
- අනෙකුත් පොදු කටයුතු සඳහා නියෝජනය කිරීම
- නීති කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම
- නීති ආධාර කටයුතු වර්ධනය කිරීම

නීති ආධාර කොමිෂන් සභාව විසින් අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධව මානව හිමිකම් කාර්යයාංශය යටතේ පෙනී සිටීමක් සිදු කරයි. ඒ යටතේ :

- අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සම්බන්ධව නීති ආධාර කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට හෝ ප්‍රාදේශීය මධ්‍යස්ථාන වලට ලැබෙන පැමිණිලි සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිටීමක් සිදු කරයි.

- අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි නීති ආධාර කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට යොමු කරනු ලබයි. අයිතිවාසිකම් උල්ලංඝනය වීම් නොවන අවස්ථාවන්හිදී අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කරයි.

- පුද්ගලයකු විසින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න අවස්ථාවන් පිළිබඳව හෝ භාෂා අයිතිවාසිකමක් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිලි කළ විට බැලූ බැල්මට අයිතිවාසිකම් උල්ලංඝණයක් පවතී නම් අගවිනිසුරුතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත අදාළ පැමිණිල්ල නීති ආධාර කොමිෂන් සභාව වෙත හෝ නිති ආධාර ලබා දීම සඳහා පවතින වෙනත් නීතිඥවරුන් වෙත හෝ කණ්ඩායමක් වෙත යොමු කළ හැකිය. මෙකී යොමු කිරීම ශ්‍රේෂ්ඨාධිකරණ රීති 44 (7) (ආ) යටතේ සිදු කරයි. නීති ආධාර කොමිෂන් සභාව වෙත එකී කරුණ යොමු වුවහොත් එම අයදුම්පත සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

### 3.2.2 නීති කොමිසම (Law Commission)

1969 අංක 32 දරණ නීති කොමිෂන් සභා පනත යටතේ පිහිටුවා ඇත. පවතින නීති තත්වයන් සලකා බැලීම මෙමගින් සිදු කරයි.
1969 අංක 32 දරණ ශ්‍රී ලංකා නීති කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියට අනුව සභාපති ඇතුළු සාමාජිකයින් 15 දෙනෙකු පස් වසරක කාල පරිච්ජේදයක් සඳහා ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාවේ කාර්යයන් ලෙස නීතිය සංග්‍රහ ගත කිරීම, විෂමතා නැති කිරීම, කාලෝචිත නොවන ප්‍රඥප්ති ඉවත් කිරීම, නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම සහ නීතිය සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් සංග්‍රහගත කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් ගනු ලැබ ඇති හෝ ගනු ලබන හෝ ක්‍රියාමාර්ගයට අගතියක් නොවන පරිදි, නීතිය සිංහලෙන් දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සංග්‍රහගත කිරීම දැක්විය හැකිය.

### 3.2.3 සමථ මණ්ඩලය (Mediation Board)

1988 අංක 72 දරණ පනත හා 1997 අංක 15 දරණ සංශෝධිත පනත යටතේ සමථ මණ්ඩලය ක්‍රියාත්මක වේ. සමථ මණ්ඩල ප්‍රදේශයක් තුල උද්ගත වූ යම් ආරවුලක් හෝ පනතේ දෙවන උපලේඛනයේ සඳහන් යම් වරදක් සම්බන්ධව සමථ කිරීම මගින් නිරවුල් කිරීම සඳහා බලතල සමථ මණ්ඩලයට හිමිවේ. මෙහිදී එක් එක් ප්‍රදේශයට අදාළව සමථ මණ්ඩල ප්‍රදේශ නම් කරන අතර නියමිත සමථ මූල මණ්ඩලය වෙත අදාළ ආරවුල පිළිබඳව ඉදිරිපත් කළ යුතුය.

වසර තුනකට වරක් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන පස් (5) සාමාජික කමිටුවකින් සමථ මණ්ඩල කොමිෂන් සභාව අන්තර්ගත වී ඇත. මොවුන් අතරින් තිදෙනෙකු උපරිමාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ ඉහළ නීතිමය තනතුරු වල නියුතු වූ අය විය යුතු අතර, මොවුන්ගෙන් එක් අයකු කොමිෂන් සභාවේ සභාපති ලෙස පත් කරනු ලැබේ.

කොමිෂන් සභාවේ ස්වාධීනත්වය තහවුරු කිරීමක් වශයෙන් අනිවාර්ය නියෝජනයක් ලෙස විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගෙන් සැදුම්ලත් මෙම සභාව, ස්වාධීන සභාවක් වශයෙන් කටයුතු කරනු ලැබේ. තවද මෙම තේරීමේ මූලික අරමුණ නම් අපක්ෂපාතීභාවය තහවුරු කිරීමය.

### 3.2.4 විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා
(Special Presidentail Commission of Inquiry)

1948 අංක 17 දරණ පනතේ බලතල ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පහත කරුණු සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පිහිටවනු ලබයි.

- රජයේ දෙපාර්තමේන්තු පිළිබඳව
- රජයේ නිලධාරීන්ගේ ක්‍රියා පටිපාටීන් පිළිබඳව විමසීම
- ඕනෑම නිති තත්ත්වයක පවතින තත්ත්වයන් විමසීම
- ජනාධිපතිවරයා විසින් මහජන ආරක්ෂාවට හෝ සුභසාධනය සම්බන්ධව වැදගත් වෙතැයි සිතන කාරණා වලදී හෝ පොදු යහපත වෙනුවෙන් වෙතැයි සිතන කාරණා සඳහා කොමිෂන් සභා පිහිටු විය හැකිය.

මෙකී විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා හි සාමාජිකයින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකාරවරයෙක් හෝ වෙනත් අධිකරණ විනිශ්චයකාරවරයෙක් විය යුතුය. මෙහිදී දිස්ත්‍රික් අධිකරණ විනිශ්චයකාරවරයෙකුගෙන් පහළ අයකු සාමාජිකයකු ලෙස පත් නොකරනු ලබයි.

ජනාධිපතිවරයා විසින් පත්කරන ලද විශේෂ කොමිෂන් සභා කිහිපයක් පහතින් දක්වා ඇත.

- 1977 අගොස්තු 13 වන දින සිට සැප්තැම්බර් 15 වන දින දක්වා සිදුවුන සිදුවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ කිරීම සඳහා පිහිටවූ වාර්ගික අර්බුද ජනාධිපති සත්‍ය කොමිෂන් සභාව [1981 – 1984])
- කොක්කඩිචෝලේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ කිරීම සඳහා පත්කරන ලද ජනාධිපති කොමිෂන් සභාව
- නීති විරෝධීව බටලන්ද නිවාස සංකීර්ණයේ රඳවා තබා ගැනීම් සම්න්ධයෙන් පරීක්ෂණ කිරීම සඳහා පත්කරනු ලැබූ කොමිෂන් සභාව
- බිඳුනුවැව පුනරුත්තාපන කඳවුරේදී සිදුවූ සමූල ඝාතන සම්බන්ධයෙන් පරීක්ෂණ කිරීම සඳහා පත්කරනු ලැබූ ජනාධිපති කොමිෂන් සභාව
- බලහත්කාරයෙන් අතුරුදහන් කරවන ලද පුද්ගලයන් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා පත්කරනු ලැබූ විශේෂ ජනාධිපති කොමිෂන් සභා

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාව (LLRC) - යුධමය ගැටුම් පවතින සමයේ සිදුවුණා වූ මානව හිමිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් සහ පුද්ගල අතුරුදහන් වීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද ජනාධිපති කොමිෂන් සභාව
- මාතලේ සමූහ මිනී වළවල් ගැන පරීක්ෂණයක් කිරීම සඳහා පත්කරන ලද කොමිෂන් සභාව

## 3.2.5 ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ඇති අනෙකුත් ආයතන

කණ්ඩායම් අයිතිවාසිකම් සම්බන්ධයෙන් මෙන්ම විශේෂිත වූ ගැටළු සම්බන්ධයෙන් සහ විවිධ පනත්වලින් විශේෂිත වූ අරමුණු සාක්ෂාත් කරගැනීමට පිහිටුවා ඇති ආයතන මින් අදහස් වේ. ඉන් සමහරක් වගුව 06 මගින් දක්වයි.

| කණ්ඩායම / විශේෂිත වූ අරමුණු | ආයතන |
|---|---|
| ළමා | • ජාතික ළමාරක්ෂණ අධිකාරිය<br>• පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>• ළමා හා කාන්තා අංශය - පොලිස් දෙපාර්තමේන්තුව<br>• අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>• සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• මහේස්ත්‍රාත් අධිකරණය<br>• මහාධිකරණය<br>• දිසා අධිකරණය<br>• කම්කරු දෙපාර්තමේන්තුව<br>• ළමයින් පිළිබඳ කමිටුව |
| කාන්තා | • කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව<br>• ළමා හා කාන්තා අංශය - පොලිස් දෙපාර්තමේන්තුව<br>• සෞඛ්‍යය දෙපාර්තමේන්තුව |

| | |
|---|---|
| කාන්තා | • සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>• කම්කරු දෙපාර්තමේන්තුව<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• මහේස්ත්‍රාත් අධිකරණය<br>• මහාධිකරණය<br>• දිසා අධිකරණය<br>• කාන්තා කාර්යාංශය |
| සංක්‍රමණික සේවකයින් | • ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය<br>• ආගමන විගමන දෙපාර්තමේන්තුව<br>• තානාපති දෙපාර්තමේන්තුව<br>- විදේශ කටයුතු අමාත්‍යාංශය |
| ආබාධිත පුද්ගලයින් | • සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික සභාව<br>• ජාතික මානසික සෞඛ්‍ය ආරක්ෂණ ආයතනය |
| වැඩිහිටියන් | • සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• වැඩිහිටියන් සඳහා වන ජාතික සභාව |
| අධ්‍යාපන | • අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>• වෘත්තීය පුහුණු ආයතනය<br>• ජාතික අධ්‍යාපන ආයතනය<br>• විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව<br>• අධ්‍යාපන සේවා කොමිසම |
| සෞඛ්‍ය | • සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>• සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය<br>• පළාත් පාලන ආයතන |

| | |
|---|---|
| සමාජ ආරක්ෂණ | • දිවි නැගුම දෙපාර්තමේන්තුව<br>• සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>• විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව |
| ආහාර | • කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>• ගොවිජන සේවා දෙපාර්තමේන්තුව<br>• පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය<br>• ආහාර දෙපාර්තමේන්තුව<br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| රැකියා | • කම්කරු දෙපාර්තමේන්තුව<br>• කම්කරු විනිශ්චය සභාව<br>• රාජ්‍ය සේවා කොමිසම<br>• කාර්මික අධිකරණය<br>• අභියාචනා විනිශ්චය සභාව |
| භාෂාව | • ජාතික භාෂා කොමිෂන් සභාව<br>• ජාතික භාෂා දෙපාර්තමේන්තුව |
| පරිසරය | • ජාතික පරිසර අධිකාරරිය<br>• වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>• සමුද්‍රය දූෂණ ආරක්ෂණ අධිකාරිය<br>• ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |

වගුව 06 : මානව හිමිකම් ආරක්‍ෂා කිරීම සඳහා ඇති අනෙකුත් ආයතන

## නිගමනය

මානව හිමිකම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් ඉහත සඳහන් පරිදි ජාත්‍යන්තරව කලාපීයව මෙන්ම දේශීයව ද බොහෝ යාන්ත්‍රණයන් පවතින අතර එකී යාන්ත්‍රණයන් සමාජය තුල මානව හිමිකම් සුරක්ෂිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

මෙකී යාන්ත්‍රණයන් සාර්ථක කර ගැනීම සඳහා ජාත්‍යන්තරව, කලාපීය හා දේශීයව සැම අයකුගේම දායකත්වය ලැබිය යුතුය. මන්ද මෙම යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම ලෝක ප්‍රජාවගේ වගකීමක් වන බැවිනි. එමගින් එහි පූර්ණ ප්‍රතිලාභයන් සැමට භුක්ති විඳීමට හැකියාව ලැබේ.

## ආශ්‍රිත ප්‍රකාශන:

- එක්සත් ජාතීන්ගේ ප්‍රතිපත්ති
- එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ අංක 60/251 දරණ ප්‍රකාශනය
- තොරතුරු පත්‍රිකා අංක 30 - එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ගිවිසුම් පද්ධතිය: ප්‍රධාන මානව හිමිකම් ගිවිසුම් සහ ගිවිසුම් සංවිධාන පිළිබඳ හැඳින්වීමක්
- රෝම ව්‍යවස්ථාව
- අප්‍රිකානු ප්‍රතිපත්තිය
- යුරෝපා සම්මුතිය
- ආසියානු ප්‍රතිපත්තිය
- අරාබි මානව හිමිකම් ප්‍රතිපත්ති
- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - 1978
- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 18 වැනි සංශෝධනය
- 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම පනත
- 1981 අංක 17 දරණ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත
- 1991 අංක 08 දරණ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනත
- 1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනත
- 1997 අංක 15 දරණ සමථ මණ්ඩල (සංශෝධන) පනත
- 1969 අංක 32 දරණ නීති කොමිෂන් සභා පනත
- 1968 අංක 27 දරණ නීති ආධාර කොමිෂන් සභා පනත

## වෙබ් අඩවි

- www.icc
- www.ohchr.org
- www.supremecourt.lk
- www.ohchr.org./EN/HRBodies/HRC
- www.icj-cij.org
- www.un.org/en/ecosco
- www.gov.lk
- www.legalaid.gov.lk
- www.justiceministry.gov.lk

ඇමුණුම් I : ජාත්‍යන්තර මානව හිමිකම් ආයතනවල ලිපිනයන්

| ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | ෆැක්ස් | ඊමේල් |
|---|---|---|---|---|
| Office of the United Nations High Commissioner for Human Rights (OHCHR) (මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය) | Palais des Nations CH-1211 Geneva 10, Switzerland | +41229179220 | | InfoDesk@ohchr.org |
| Special Procedures Division - Human Rights Council (විශේෂ කාර්ය පටිපාටි අංශය - මානව හිමිකම් කවුන්සිලය) | Special Procedures Division c/o OHCHR-UNOG 8-14 Avenue de la Paix 1211 Geneva 10 Switzerland | | +41 22 917 90 06 | urgent-action@ohchr.org |
| Complaint Procedure unit – Human Rights Council පැමිණිලි කාර්ය පටිපාටි ඒකකය - මානව හිමිකම් කවුන්සිලය | Complaint Procedure Unit Human Rights Council Branch Office of the United Nations High Commissioner for Human Rights United Nations Office at Geneva CH-1211 Geneva 10, Switzerland | | (41 22) 917 90 11 | CP@ohchr.org |
| Human Rights Committee (ICCPR) For individual complaints<br><br>මානව හිමිකම් කමිටුව (තනි පුද්ගල පැමිණිලි සඳහා) | UNOG-OHCHR CH-1211 Geneva 10 (Switzerland)<br><br>Petitions Team Office of the High Commissioner for Human Rights United Nations Office at Geneva 1211 Geneva 10 (Switzerland) | +41 22 917 92 61 | +41 22 917 90 08<br><br>+ 41 22 917 9022 (particularly for urgent matters) | ccpr@ohchr.org<br><br>petitions@ohchr.org |
| Committee on Economic, Social and Cultural Rights (CESCR) | UNOG-OHCHR CH-1211 Geneva 10 (Switzerland) | +41 22 917 90 00 | +41 22 917 90 08 | cescr@ohchr.org |

| | | | | |
|---|---|---|---|---|
| ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් කමිටුව<br><br>Committee on the Elimination of Racial Discrimination (CERD)<br><br>For individual<br>වාර්ගික වෙනස්කම් තුරන්කිරීමේ කමිටුව (තනි පුද්ගල පැමිණිලි සඳහා) | UNOG-OHCHR<br>CH-1211 Geneva 10<br>(Switzerland)<br><br>Petitions Team<br>Office of the High Commissioner for Human Rights<br>United Nations Office at Geneva 1211 Geneva 10<br>(Switzerland) | +41 22 917 97 57 | +41 22 917 90 08<br><br>+ 41 22 917 9022<br>(particularly for urgent matters) | cerd@ohchr.org<br><br>tb-petitions@ohchr.org |
| Committee on the Elimination of Discrimination against Women (CEDAW)<br><br>For individual complaints<br>කාන්තාවන්ට එරෙහි වෙනස්කම් තුරන් කිරීමේ කමිටුව<br>(තනි පුද්ගල පැමිණිලි සඳහා) | UNOG-OHCHR<br>CH-1211 Geneva 10<br>(Switzerland)<br><br>Petitions Team<br>Office of the High Commissioner for Human Rights<br>United Nations Office at Geneva<br>1211 Geneva 10<br>(Switzerland) | +41 22 917 94 43 | +41 22 917 90 08<br><br>+ 41 22 917 9022<br>(particularly for urgent matters) | cedaw@ohchr.org<br><br>petitions@ohchr.org |
| Committee against Torture (CAT)<br><br>වධහිංසාවට එරෙහි කමිටුව<br>(තනි පුද්ගල පැමිණිලි සඳහා)<br><br>For individual complaints | UNOG-OHCHR<br>CH-1211 Geneva 10<br>(Switzerland)<br><br>Petitions Team<br>Office of the High Commissioner for Human Rights<br>United Nations Office at Geneva 1211 Geneva 10<br>(Switzerland) | +41 22 917 97 06 | +41 22 917 90 08<br><br>+ 41 22 917 9022<br>(particularly for urgent matters | cat@ohchr.org<br><br>petitions@ohchr.org |

| | | | | |
|---|---|---|---|---|
| Committee on the Rights of the Child (CRC)<br><br>ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව<br><br>Committee on Migrant Workers (CMW) | UNOG-OHCHR<br>CH-1211 Geneva 10<br>(Switzerland)<br><br>UNOG-OHCHR<br>CH-1211 Geneva 10<br>(Switzerland) | +41 22 917 91 41<br><br>+41 (0) 22 917 9335 | +41 22 917 90 08<br><br>+41(0)22 917 9008 | crc@ohchr.org<br><br>cmw@ohchr.org |
| For individual complaints<br>සංක්‍රමණික සේවයන් පිළිබඳ කමිටුව<br>(තනි පුද්ගල පැමිණිලි සඳහා) | Petitions Team<br>Office of the High Commissioner for Human Rights<br>United Nations Office at Geneva<br>1211 Geneva 10<br>(Switzerland) | | +41 22 917 9022<br>(particularly for urgent matters) | tb-petitions@ohchr.org |
| Committee on the Rights of Persons with Disabilities (CRPD)<br><br>For individual complaints:<br>ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුව<br>(තනි පුද්ගල පැමිණිලි සඳහා) | UNOG-OHCHR<br>CH-1211 Geneva 10<br>(Switzerland)<br><br>Petitions Team<br>Office of the High Commissioner for Human Rights<br>United Nations Office at Geneva<br>1211 Geneva 10<br>(Switzerland) | +41 22 917 97 03 | +41 22 917 90 08<br><br>+ 41 22 917 9022<br>(particularly for urgent matters) | crpd@ohchr.org<br><br>petitions@ohchr.org<br><br>ced@ohchr.org |
| Committee on Enforced Disappearance (CED)<br>බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ කමිටුම | UNOG-OHCHR<br>CH-1211 Geneva 10<br>(Switzerland) | +41 22 917 92 56 | +41 22 917 90 08 | |
| International Court of Justice<br>ජාත්‍යන්තර අධිකරණය | Peace Palace<br>Carnegieplein 2<br>2517KJ The Hague,<br>The Netherlands | (+31)(0)70 302 2323 | (+31)(0)70 364 99 28 | |
| International Criminal Court<br>ජාත්‍යන්තර අපරාධ අධිකරණය | Po Box 19519<br>2500 CM, The Hague<br>The Netherlands | + 31 (0)70 515 8515 | +31 70 515 8555 | otp.informationdesk@icc-cpi.int |

**ඇමුණුම ii : මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් සහන ලැබිය හැක දේශීය ආයතනවල ලිපිනයන්**

| ආයතනය | ලිපිනය | දුරකථන අංක | විද්‍යුත් තැපැල් | ඊමේල් |
|---|---|---|---|---|
| **ශ්‍රේෂ්ඨාධිකරණය** | උපරිමාධිකරණ සංකීර්ණය, මිහිඳු මාවත, කොළඹ 12. | 011 2 435446 | 011 2435446 | |
| **පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ මහකොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)** | නො. 06, එළිබෑන්ක් පාර, කොළඹ 05. | 011 2588798 | 0112584140 | ombudssl@sltnet.lk |
| **නීති ආධාර කොමිෂන් සභාව** | නො. 129, මිහිඳු මාවත, කොළඹ 12. | +94-11-5335329 / +94-11-5335281 | +94-11-2433618 | legalaid@sltnet.lk |
| **නිති කොමිෂන් සභාව** | නො. 80, නව ගොඩනැගිල්ල, අධිකරණ අමාත්‍යාංශය, 4 වන මහළ, අධිකරණ මාවත, කොළඹ 12. | +94-11-2333884 | +94-11-2333884 | seclawsl@sltnet.lk |
| **සමථ මණ්ඩල කොමිෂන් සභාව** | අධිකරණ අමාත්‍යාංශය, 3 වන මහළ, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12. | 011 2334323 | 0112334323 | |

**ඇමුණුම් iii : ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමග සම්බන්ධ විය හැකි ආකාරයන්**

## (අ) ප්‍රධාන කාර්යාලය

ලිපිනය : නො.165, කින්සි පාර, කොළඹ 08
දුරකථන : 011-2694925, 2685980, 2685981
ක්ෂණික ඇමතුම් : 1996
ෆැක්ස් : 011-2694924
විද්‍යුත් තැපෑල : sechrc@sltnet.lk
වෙබ් අඩවිය : www.hrcsl.lk
සභාපති : 011 2696470
ලේකම් : 011 2689558
නීති ලේකම් : 011 2694222
අධ්‍යක්ෂ - පරීක්ෂණ සහ විමර්ශන : 011 2674200
අධ්‍යක්ෂ - අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් : 011 2686282
අධ්‍යක්ෂ - අධීක්ෂණ සහ සමාලෝචන : 011 2673806
අධ්‍යක්ෂ - පරිපාලන සහ මූල්‍ය : 011 2662098

## (ආ) ප්‍රාදේශීය කාර්යාල

| ප්‍රාදේශීය කාර්යාල | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| **මහනුවර.** | 8/1, ප්‍රිම්රෝස් පටුමග, පේරාදෙනිය පාර, මහනුවර. | 081-2228009 |
| **මාතර** | 15, කාලිදාස පාර, මාතර. | 041-2226533 |
| **මඩකලපුව.** | 24, සින්න උප්පොඩෙ පාර, මඩකලපුව. | 065-2224420 |
| **අනුරාධපුරය.** | 623/20 ඊ , ජ්‍රීමන් පාර, අනුරාධපුරය. | 025-2234801 |
| **ත්‍රිකුණාමලය.** | 227, මහ වීදිය, ත්‍රිකුණාමලය. | 026-2222607 |
| **වව්නියාව.** | 26/2, පිට රවුම් පාර, වව්නියාව. | 024-2222029 |
| **බදුල්ල.** | 19/1,බී බදුලුපිටිය පාර, බදුල්ල. | 055-2223020 |
| **අම්පාර** | 4, වන සැතපුම් කණුව, උහන පාර කරන්ගාව අම්පාර | 063-2222340 |
| **කල්මුණේ.** | 161/1, මහ වීදිය, කල්මුණේ. | 067-2229728 |
| **යාපනය.** | 1,3 වෙනි හරස් වීදිය, යාපනය. | 021-2222021 |